## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2010

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 03

(i) ශේෂ පත්‍රයේ මුහුණත ආයෝජන වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් හා ජංගම බැරකම් වර්ගීකරණ කිහිපයක් යටතේ දැක්විය යුතු වුවද අධිකාරිය සියළු ජංගම වත්කම් හා ජංගම බැරකම් එවැනි වර්ගීකරණයකින් තොරව දක්වා තිබුණි.

1.2.2 **නොසැසඳු පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන අනුව ලී බඩු හා සවිකිරීම්වල සහ යන්ත්‍ර හා පිරියතවල එකතු වටිනාකම රු.30,356,713 ක් වුවද උපලේඛන අනුව එම එකතු වටිනාකම රු.27,574,955 ක් වුයෙන් රු.2,781,758ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගණුම් වලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.132,268,342 ක් හිඟ හිටව පැවති අතර ඉන් රු. 11,705,974 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟහිටි ශේෂ වශයෙන් පැවතුණි. එසේම ගෙවිය යුතු ගිණුම් වලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.348,162,618 ක් නොපියවා පැවතුණු අතර ඉන් රු. 203,664,853 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නොපිය වූ ශේෂ වශයෙන් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් 25 කට අදාලව රු. 59,062,370 ක් වූ ලැබිය යුතු ශේෂ සඳහා සනාථ කිරීම් ද ගිණුම් 42 කට අදාලව රු. 67,326,542 ක් වූ ගෙවිය යුතු ශේෂයන් සඳහා සනාථ කිරීම් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.2.4 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර බදු විශේෂ විධිවිධාන පනත | නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය වූ ගෙවීම් අවස්ථා 89 කට අදාල රු.2,175 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි104 | සමාලෝචිත වර්ෂය තුළ රු.842,632 ක වාහන අනතුරක් සිදු වී තිබුණ ද අලාභ හානි සම්බන්ධව මු.රෙ. විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | පෞද්ගලික පාවිච්චිය සඳහා යොදාගැනීමට හිමිකම් ඇති නිලධාරීන් සඳහා වෙන්කොට ඇති රජයේ වාහන හැර අනෙකුත් සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය යොදා එම ආයතනයේ නම ද සඳහන් කල යුතු වුවත් එසේ කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය බදු වලට පෙර රු.349,904,721 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බදු වලට පෙර ලාභය රු.307,973,373 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.41,931,348 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම සහ සේවා සැපයීමෙන් ලැබූ ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට බලපා තිබුණි.

#### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම 18.63 % ක වැඩිවීමක් ද පුනරාවර්තන වියදම 28.77 % ක වැඩිවීමක් ද පෙන්වන අතර, සමාලෝචිත වර්ෂයේ බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය 13.61 % කින් වැඩිවී තිබුණි.

#### 2.1.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පුද්ගල හදිසි අනතුරු වන්දි සඳහා 2010 ජනවාරි 01 සිට 2010 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.179,322 ක් ගෙවමින් රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබියදී, 2010 අගෝස්තු 17 දින සිට 2011 අගෝස්තු 01 දක්වා කාලපරිච්ඡේදයට වෙනත් රක්ෂණ සමාගමකින් පුද්ගල හදිසි අනතුරු සඳහා රු.72,860 ක් ගෙවා රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණි.

(ආ) වර්ෂය ආරම්භයේ ආපසු ලැබිය යුතු රු.11,578,000 ක එකතුකල අගය මත බදු මුදල සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විට රු.14,434,077 ක් වී තිබුණ ද, එවැනි මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අධිකාරියට ලැබීමට තිබෙන බව තහවුරු නොවුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

පහත සඳහන් කාර්ය සාධන දර්ශක අනුව ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනයේ අඩු වීමක් දක්නට ලැබුණි.

| | විෂයය | විස්තරය | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| (අ ) | ගුවන් යානා චලන | (i ) කුලී පියසර | 1,024 | 1,057 | 1,317 |
| | | (ii) නිත්‍ය ගුවන් ප්‍රවාහන සමාගම්- පියසර | 30,621 | 27,545 | 32,590 |
| (ආ) | සම්පූර්ණ කරන ලද විගණන | මෙහෙයුම් | 02 | 01 | 01 |
| | | ඒකාබද්ධ (මෙහෙයුම් හා යෝග්‍යතාව ) | 01 | -- | -- |
| | | ගගන යාත්‍රාංගනය | 01 | 01 | -- |
| (ඇ) | ඉටුකරන ලද නිරුපද්‍රිත / සුරක්ෂිත හා අධීක්ෂණ කාර්යයන් | (i) රුැම්ප් පරීක්ෂණ (ගුවන් යෝග්‍යතාවය) | 23 | 72 | 30 |
| | | (ii) රුැම්ප් පරීක්ෂණ (ඒකාබද්ධ) | 02 | -- | -- |
| | | (iii) ගගන යාත්‍රාංගනය | 09 | 10 | 09 |
| | | (iv) අන්තරාකාර භාණ්ඩ | -- | 19 | 08 |

### 2.2.2 සේවා ගාස්තු

අධිකාරය විසින් ගුවන් නියමු බලපත්‍ර ලබාදීම, උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම ආදී වූ විවිධ සේවාවන් සැපයීම සඳහා අයකරනු ලබන ගාස්තු පසුගිය වසර 06 ක් තුල සංශෝධනය කර නොතිබුණි. මේ නිසා අධිකාරයට එම සේවා සැපයීම සඳහා දරන මුදලට ප්‍රමාණවත් පරිදි ගාස්තුවක් හෝ නොලැබෙන බව නිරීක්ෂණය විය.

### 2.2.3 ආර්ථික නොවූ ගනුදෙනු

අධිකාරිය විසින් පාඨමාලා පැවැත්වීම සඳහා සංස්ථාවකට අයත් ගොඩනැගිල්ලක් කුලී පදනමට ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණේ 20 දෙනෙකුට මාස 03 ක එක් පාඨමාලාවක් පමණි. මේ සඳහා රු.972,593 ක වියදමක් දරා තිබුණ ද පාඨමාලා පැවැත්වීමෙන් ලැබී තිබුණේ රු.384,136 ක් පමණක් වූයෙන් රු.588,457 ක පාඩුවක් අධිකාරියට සිදු වී තිබුණි.

### 2.2.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ දී ඇස්මේන්තු ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, 75% සිට 165% දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපති දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ ) ආදායම් රැස්කිරීම

(ආ) වියදම් කළමනාකරණය

(ඇ) බලපත්‍ර ගාස්තු